(381)


My No. CA/CA/315/2020

Your No.

Telephone Nos. 2147888 / 2433967 / 2433769 / 2320800 / 2327919

administration@attorneygeneral.gov.lk

Fax 2436421

නීතිපති දෙපාර්තමේන්තුව
சட்டமா அதிபர் திணைக்களம்
ATTORNEY - GENERAL'S DEPARTMENT

තැ. පෙ. අංකය
அஞ்சல் பெட்டி
P.O. Box No. 502

කොළඹ 12.
கொழும்பு 12
Colombo 12.


2020.12. 21

Att: Mr Gamini Adhikar

01. කොමසාරිස් ජනරාල්,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
14 වන මහල,
දේශීය ආදායම් ගොඩනැගිල්ල,
කොළඹ 02.

02. සුරාබදු කොමසාරිස් ජනරාල්,
සුරාබදු දෙපාර්තමේන්තුව,
නො.353, කෝට්ටේ පාර,
රාජගිරිය.

**අභියාචනාධිකරණ නඩු අංක රිට් 438/2020 හා 292/2020 2006 අංක 12 දරන මුද්දර ගාස්තු පනතේ (සංශෝධිත පරිදි) විධිවිධාන හා නියෝග ප්‍රකාරව මත්පැන් විකිණීම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර හා බෝතල් රා විකිණීම සඳහා නිකුත් කරන ලද බලපත්‍ර මත හිඟ මුද්දර ගාස්තු අය කිරීම හා 2021 වසර සඳහා නව මත්පැන් විකිණීමේ බලපත්‍ර නිකුත් කිරීම**

ඔබ විසින් එවන ලද 2020.12.18 දිනැති ලිපිය කඩිනමින් මා වෙත ලබා දීම පිළිබඳව කෘතඥතාවය පළ කර සිටින අතර, එහි සඳහන් කරුණු අනුව හිඟ මුද්දර ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් අදාළ සියලු පාර්ශවයන් එක්ව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ස්ථාවරයක් ගන්නා තෙක් 2021 වසර සඳහා උක්ත නඩු දෙකෙහි පෙත්සම්කරුවන් ඉල්ලා ඇති බලපත්‍ර (අනෙකුත් නීතිමය රෙගුලාසි හා ක්‍රියාමාර්ග ගෙන ඇත්නම් පමණක්) නිකුත් කිරීමට කටයුතු යොදන බව ගරු අභියාචනාධිකරණයට දන්වා සිටින ලද අතරම, එය ගොනු ගත කරන ලදි. එකී ජර්නල් සටහන් ඔබ වෙත නොපමාව ලැබීමට සලස්වමි.

එසේ හෙයින්, ඉහත නඩුවල ඇති වූ එකඟතාවය මත බලපත්‍ර ලබා ගැනීමේ දී පිළිපැදිය යුතු නීත්‍යානුකූල ක්‍රියා මාර්ග හා රෙගුලාසි අනුගමනය කර ඇත්නම්, 2021 වර්ෂය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා කඩිනමින් ක්‍රියා මාර්ග ගන්නා ලෙසට සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලිඛිතව දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

(signature)

ජායා ශ්‍රී තම්මුණි,
ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ,
නීතිපති වෙනුවට.

පිටපත් : 01. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය, මොරටුව.
2021 බලපත්‍ර නිකුත් කිරීම සඳහා

02. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නුවර හා ගඟවට කෝරළේ.
2021 බලපත්‍ර නිකුත් කිරීම සඳහා

BO/CA-CA-315-2020-A

කොමසාරිස් ජනරාල් / ஆணையாளர் நாயகம் / Commissioner General } 2300166 / 2326606

කොමසාරිස් (ආදායම්) / ஆணையாளர் (வருமானம்) / Commissioner (Revenue) } 2300160

කොමසාරිස් (පාලන හා මානව සම්පත්) / ஆணையாளர் (நிர்வாகம் /மனித வளம்) / Commissioner ( Admin / Human Resource) } 2300163

ෆැක්ස් / தொலைநகல் / Fax } 2300165

ඊ-මේල් / மின்னஞ்சல் / E-Mail } excisen@slt.lk

තැ.පෙ. අංකය / த.பெ.இல / P.O.Box No } 1417


# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA


අංක 353,පරණ කෝට්ටේ පාර, රාජගිරිය . இல.353, பழைய கோட்டை வீதி, இராஜகிரிய. *No.353, Old Kotte Road, Rajagiriya*


මගේ අංකය. / எனது இல. / **My No.** } 'ED/LB /04/පොදු

ඔබේ අංකය. / உமது இல. / **Your No.** }

දිනය / திகதி / **Date** } 2020.12.22

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**<u>අභියාචනාධිකරණ නඩු අංක රිට් 438/2020 හා 292/2020</u>**
**<u>2006 අංක 12 දරණ මුද්දර ගාස්තු පනතේ ( සංශෝධිත පරිදි) විධිවිධාන හා නියෝග ප්‍රකාරව මත්පැන් විකිණීම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර හා රා බෝතල් විකිණීම සඳහා නිකුත් කරන ලද බලපත්‍ර මත හිඟ මුද්දර ගාස්තු අය කිරීම හා 2021 වසර සඳහා නව මත්පැන් විකිණීමේ බලපත්‍ර නිකුත් කිරීම.</u>**

උක්ත කරුණට අදාළව ගරු අභියාචනාධිකරණ නඩුවේදී 2018.12.18 දින එළඹී එකගතාවයට අනුව ගරු අධිකරණය විසින් දෙනු ලැබූ තීරණයකින් බැඳී, ඒ අනුව කටයුතු කරන තෙක් බලපත්‍ර ලබාගැනීමේදී පිළිපැදිය යුතු නීත්‍යානුකූල ක්‍රියාමාර්ග හා රෙගුලාසි අනුගමනය කර ඇත්නම් , හිඟ මුද්දර ගාස්තු අයකිරීම නොසලකා හැර 2021 වර්ෂයට අදාළ මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙසට නීතිපතිවරයා විසින් දැනුම් දී ඇත.

02. ඒ අනුව සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට සකස් කල මාගේ අංක ED/04/01/20/1 හා 2020.12.22 දිනැති ලිපිය මේ සමඟ ඔබ වෙත යොමු කරන අතර ඒ සම්බන්ධයෙන් සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් දැනුවත් කරන ලෙසට කාරුණිකව දන්වමි.

එම්.ජේ.ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්

සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General
3888022
3888023

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් ප්‍රතිපත්ති හා පාලන)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமானக் கொள்கை, நிர்வாகம்)
Additional Commissioner General (Revenue Policy & Admin)
2045050

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமான முகாமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement)
2877891

ෆැක්ස්
பெக்ஸ்
Fax
2877890

ඊ-මේල්
மின்னஞ்சல்
E-Mail
excisen@slt.lk

දුරකථන අංකය
தொலைபேசி எண்.
Telephone No
2045000

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA

අංක 353, කෝට්ටේ පාර, රාජගිරිය. இல. 353, கோட்டை வீதி, இராஜகிரிய. No 353, Kotte Road, Rajagiriya.

මගේ අංකය
எனது இல:
My No. ED/04/01/20/1

ඔබේ අංකය
உமது இல:
Your No.

දිනය
திகதி
Date 2020.12.22

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත,

**<u>අභියාචනාධිකරණ නඩු අංක රිට් 438/2020 හා 292/2020</u>**

**<u>2006 අංක 12 දරන මුද්දර ගාස්තු පනතේ (සංශෝධිත පරිදි) විධිවිධාන හා නියෝග ප්‍රකාරව මත්පැන් විකිණීම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර හා බෝතල් රා විකිණීම සඳහා නිකුත් කරන ලද බලපත්‍ර මත හිඟ මුද්දර ගාස්තු අය කිරීම හා 2021 වසර සඳහා නව මත්පැන් විකිණීමේ බලපත්‍ර නිකුත් කිරීම.</u>**

උක්ත අංක දරණ ගරු අභියාචනාධිකරණ නඩුවේදී 2018.12.18 දින එළඹි එකඟතාවයට අනුව ගරු අධිකරණය විසින් දෙනු ලබන තීරණයකින් බැඳී, ඒ අනුව කටයුතු කරන තෙක් බලපත්‍ර ලබාගැනීමේදී පිළිපැදිය යුතු නීත්‍යානුකූල ක්‍රියාමාර්ග හා රෙගුලාසි අනුගමනය කර ඇත්නම්, හිඟ මුද්දර ගාස්තු අයකිරීම නොසලකා හැර 2021 වර්ෂයට අදාළ මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙසට නීතිපතිවරයා විසින් දැනුම් දී ඇත.

02. ඒ අනුව ඉහත සඳහන් පරිදි හිඟ මුද්දර ගාස්තු අයකිරීම නොසලකා 2021 වර්ෂයට අදාළ මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එම්. ජේ. ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්

එම්. ජේ. ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
353, කෝට්ටේ පාර,
රාජගිරිය